බලංගොඩ අධ්‍යාපන කලාපය

7 ශ්‍රේණිය නර්තනය

## කතරගම පෙරහැර

- කතරගම පෙරහැර සිංහල, හින්දු, මුස්ලිම්, ආදිවාසීන් ආදී සියලු ජනයාගේ ආගමික පෙරහැරක් ලෙස හැඳින්වේ.
- දේවාශීර්වාදය ලැබීම, බැතිමතුන්ගේ අපල උපද්‍රව දුරු කිරීම, සශ්‍රීකත්වය ලබා ගැනීම පෙරහැර පැවැත්වීමේ මූලික අරමුණු වේ.
- පෙරහැර පැවැත්වෙන කාල සීමාව ලෙස කප් සිටුවීමෙන් දින 44කින් පසු එළඹෙන අමාවක් ගෙවී පුර පෑළවිය දිනයේ පුස නැකතින් ආරම්භ වේ.
- අවුරුදු මංගල්‍ය, ඇසළ උත්සවය, ඉල්මහ මංගල්‍ය වශයෙන් චාරිත්‍රානුකූල ප්‍රධාන උත්සව තුනකි.
- ගිනිපෑගීම, බිම පෙරළීම, කටු ගැසීම, වත බැඳීම ආදී චාරිත්‍ර මෙහි දැකිය හැක.
- ඇසළ පුර පසළොස්වක ගෙවී අව පෑළවිය ලබන දිනයේදී වේගවත් පෙරහැර නමින් විශේෂ පෙරහැරක් පැවැත්වේ.
- නිලධාරීන් ඉදිරියේ පැවැත්වෙන හේවිසි වාදනයේදී වීර පදය නමින් විශේෂ පදයක් වාදනය කරයි.
- පෙරහැර ඉදිරියෙන්ම සිටින්නෝ කොඩි ගෙන යන්නෝ වෙති.
- ත්‍රිවිධ සම්ප්‍රදායන්ට අයත් නර්තන අංග මෙන්ම ගැමි නැටුම් ද මෙහි දැකිය හැක.
- ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි කාවඩි නැටුම, මොණර නැටුම, හනුමන්තා නැටුම, කොහොඹ කළය මෙම පෙරහැරේ සුවිශේෂී අංගයෝ වෙති.
- හේවිසි වාදනය මෙන් ම දමිළ බෙරය, නාගස්වරම් ආදී භාණ්ඩ වාදනය කිරීම මෙම පෙරහැරේ දැකිය හැක.
- ගායනය, වාදනය, නර්තනය සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම සහභාගී වෙති.